# නිවේදන

## උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ සහකාර මේට්‍රන් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2026

උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර මේට්‍රන් තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් ලත් අපේක්ෂිකාවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.05.29 වන අතර , බඳවා ගැනීමේ තරඟ විභාගය 2026 අගොස්තු මස අනුරාධපුර නගරයේදී පවත්වනු ලැබේ.

**පුරප්පාඩු සංඛ්‍යාව 02**

**01. අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් -**

**1.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් -**

**අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.**

(අ) අ.පො.ස. ( සා.පෙළ) විභාගය සිංහල /දෙමළ භාෂාව , ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හතරකට (04) සම්මාන සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

සහ

(ආ) අ.පො.ස. ( උ.පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් එකක් (01) සමත්ව තිබීම. (පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර )

සහ

(ඇ) රජයේ හෝ පිළිගත් ආයතනයක උපදේශනය /සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

(ඈ) රජයේ හෝ අනුබද්ධිත පෞද්ගලික රෝහලක සාත්තු සේවිකාවක ලෙස වසර එකකට (01) වැඩි පළපුරුද්දක් හෝ උතුරු මැද පළාත තුළ පිහිටි ස්වෙච්ඡා ළමා නිවාසයක මේට්‍රන් / සහකාර මේට්‍රන් ලෙස වසර දෙකකට (02) වැඩි සේවා කාලයක් සේවය කර තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**1.2 කායික සුදුසුකම් -**

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**1.3 වෙනත් සුදුසුකම්**

I. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක් (03) අඛණ්ඩව උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. ( අයදුම්කරු මෙම පළාතේ වසර තුනකට (03) වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ)

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත කාන්තාවක් විය යුතුය.

**02. වයස**

**2.1** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. දැනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

**03. වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය:**

MN 1 – 10/2025 වැටුප් ක්‍රමයට අදාලව රු: 45230-540x10-630x11-890x10-1190x10 – 78360/-

(රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 10/2025 II උපලේඛණයේ විධිවිධාන අනුව ගෙවීම් සිදු කරනු ලබයි.)

**04.** **බඳවා ගන්නා ක්‍රමය : විවෘත**

**4.1**. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවා අයදුම්කරුවන් තරඟ විභාගයකට භාජනය කිරීමෙන් අනතුරුව 1990.03.09 වැනි දිනැතිඅංක 15 /90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන වලට අනුකූලව III ශ්‍රේණියේ සහකාර මේට්‍රන් තනතුරට බඳවා ගනු ලබයි. එසේ බඳවා ගැනීමේදී පවතින පුරප්පාඩු වලින් 50% ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන්ද 50% බාහිර අයදුම්කරුවන්ගෙන්ද බඳවා ගනු ලැබේ. සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී සියළුම පුරප්පාඩු බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. (ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් අතුරින් කුසලතාවය අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.)

**05.** **තරඟ විභාගයේ විෂය නිර්දේශය:**

**5.1.මෙම පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.**

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය | 100% | 40% |
| ළමුන්ගේ කායික මානසික සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න පත්‍රය | 100% | 40% |

විභාගය පවත්වනු ලබන බලධාරියා - උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**06.** **විභාගය පවත්වන භාෂා මාධ්‍යය.**

මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම්පත්‍ර සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින මාධ්‍යයෙනි

**07.** **විභාගය සඳහා වන විෂය නිර්දේශය.**

| විෂයන් | විෂය නිර්දේශය |
|---|---|
| අ.) අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය | ➢ අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන් , තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහු වරණ ප්‍රශ්න පත්‍රයකි. එහි වාස්තවික (Objective Type). ප්‍රශ්න 50ක් ඇතුලත් වේ. |
| ආ.) ළමුන්ගේ කායික මානසික සංවර්ධන පිළිබඳ ප්‍රශ්න පත්‍රය | ➢ ළදරුවන්ට හා ළමුන්ට වැළදෙන රෝග සරල ප්‍රථමාධාර , එම රෝග වලක්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍යාරක්ෂිත ක්‍රම<br>➢ ළදරු හා ළමාවියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හා ආහාර ලබා දීමේදී අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු<br>➢ ළදරු හා ළමාවියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම<br>(බහු වරණ ප්‍රශ්න 50ක් ඇතුලත් වේ.) |

**08.සේවා නියුක්ත කරවීමේ කොන්දේසි:**

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් දැනට රජයේ සේවයේ නියුක්ත නොවන්නේ නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාල තනතුරට පත් කරනු ඇත.

3. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුව හොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වනු ඇත.

4. තනතුරේ ස්ථිර කිරීම සඳහා උතුරු මැද පළාත් සහකාර මේට්‍රන් තනතුරට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු අතර , සමත් වූ නිලධාරීන් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ VII වන පරිච්ඡේදය ප්‍රකාරව ස්ථිර කිරීම සිදු කෙරේ.

5. බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් 2020.10.16 දිනැති අංක 18/2020 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට අනුව තමන් සේවයට බැඳි වසර 05 ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව / භාෂා පිළිබඳව නියමිත ප්‍රවීණතාව ලබා ගත යුතුය.

6. මෙම තනතුරට පත්වන නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට , පළාත් මූල්‍ය රීති , දෙපාර්තමේන්තු නියෝග , රජය හා පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නියමයන් හා රෙගුලාසි වලට යටත් විය යුතුය.

**09. අයදුම් කල යුතු පිළිවෙළ**

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ ( සෙ.මී.21x25) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතුය. ( අයදුම්පත්‍රය පිලියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම , සිංහල හා දෙමළ අයදුම්පත්‍ර වල සිංහල හා දෙමළ භාෂාවෙන් යෙදීම අවශ්‍ය වේ. ) ඉල්ලුම්පත්‍රයේ අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කල යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර , අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026.05.29** දින හෝ ඊට පෙර ලැබෙන සේ **" ලේකම් , උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව , මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර . "** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" සහකාර මේට්‍රන් තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026 "** යනුවෙන් සඳහන් කල යුතුය.

**10. අයදුම්පත් භාර ගැනීම :**

නියමිත ආකෘතියට අනුකූල නොවන , අසම්පූර්ණ , සුදුසුකම් සපුරා නැති අයදුම්පත් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිලිබඳව කෙරෙන කිසිඳු පැමිණිල්ලක් සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

**11**. මෙම නිවේදනයේ සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත , නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතිකපත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරණ නිළධාරියෙකු අයදුම්කරුවෙකු වන්නේ නම් ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය. එසේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**12. විභාග ගාස්තු :**

රු.720/- ක විභාග ගාස්තුවක් අයදුම්කරු උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ඒ සඳහා ලබා ගත් ලදුපත (NC- 100) ඉල්ලුම්පතෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ. ( මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ උතුරු මැද පළාත් සභාවේ අංක 2003.02.13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන ලෙසටය . ) මෙම ලදුපත නොමැතිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ . කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බවද සැලකිය යුතුය. මුදල් ගෙවා ලබා ගත් ලදුපතේ ඡයා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

**13. විභාගයට පෙනී සිටීම :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත විභාගය පවත්වන දිනට ප්‍රථම තම ප්‍රවේශ පත්‍ර නොලැබුණ අපේක්ෂකයින් වෙතොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඒ පිළිබඳව විමසිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී, පෙනී සිටින සෑම විෂයක් පාසාම , විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු අතර ,ඒ සඳහා පිළිගනු ලබන්නේ <u>පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත , රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය</u> හෝ පමණි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියළුම නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඩුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත

**14.සාවද්‍ය තොරතුරු සැපයීම.**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරනය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හො ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. යම් හෙයකින් තෝරා පත්කර ගැනීමෙන් පසුව කිසියම් තොරතුරක් සාවද්‍ය බව සේවය ස්ථිර කිරීමෙන් අනාවරණය වුව හොත් හොත් ඔහු / ඇය සේවයෙන් පහකරනු ලැබේ. සේවය ස්ථිර කිරීමට පෙර අනාවරණය වුව හොත් ඔහුගේ/ ඇයගේ පත්වීම අවසන් කරනු ලැබේ.

**15**. මෙම විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත
2026.04.29

# අයදුම්පත්‍රය

## උතුරු මැද පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර මේට්‍රන් III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

( කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - S දෙමළ - T

(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න. මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

01\. I. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම : ........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

II\. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම : ........................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

02\. මුලකුරු වලින් හැඳින්වෙන නම : ........................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

03\. I. ස්ථිර ලිපිනය : ........................................................................................

04\. I. විභාග ප්‍රෙවිශ පත්‍ර එවිය යුතු ලිපිනය : ........................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

II\. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ........................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

05\. උපන් දිනය

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස (2026.05.29)

අවු : ☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

06\. විවාහක අවිවාහක බව : ☐

(විවාහක √, අවිවාහක X)

07\. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

08\. දුරකතන අංකය :........................................................................................

09\. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන්ද? : ..........................................................................

I. අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................

II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........................................................................

III. ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..........................................................................

IV. පළාත තුල පදිංචිය සිටින කාල සීමාව : ...............දින සිට ....................දින දක්වා
අවුරුදු ......................... මාස ..................

V. පළාතේ පදිංචිය වසර 03ක් නොමැති විට
කලත්‍රයා පළාත තුළ පදිංචි කාලය : ...............දින සිට ....................දින දක්වා

10. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්.

(අදාළ සහතික පිටපත් අමුණා එවිය යුතුයි.)

10.1 අ.පො.ස( සා.පෙළ) වර්ෂය :-........................... විභාග අංකය :- ..............................................

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. ................................ | ............. | V. ……………………… | ……….. |
| II. …………………..... | ……….. | VI. ………………………. | ……….. |
| III. ………………….. | ……….. | VII. ………………………. | ………. |
| IV. ………………….. | ……….. | VIII ………………………. | ………. |

10.2 අ.පො.ස. ( උ. පෙළ) වර්ෂය :-......................... විභාග අංකය :- ..............................................

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1. ................................ | ............. |
| II. …………………..... | ……….. |
| III. ………………….. | ……….. |
| IV. ………………….. | ……….. |

11. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිලිබඳ විස්තර ( අදාළ වේ නම්)

| දෙපාර්තමේන්තුව / ආයතනය | තනතුර | කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |
| | | | |

12. විභාග ගාස්තු රු. 720/- ගෙවූ බවට අදාළ තොරතුරු :

I. විභාග ගාස්තු ගෙවූ ලදු පතේ අංකය : ....................................................

II. දිනය : ....................................................

III. ලදුපත ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ....................................................

ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.

(ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා ඇතිද? ................................................

එසේනම් විස්තර දක්වන්න : ................................................................................................

......................................................................................................................................

14. මෙම අයදුම්පතේ මම විසින් සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳව දක්වා ඇති කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් , තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙලිවුව හොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය. ......................................  ..................................................

අයදුම්කරුගේ අත්සන

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරිම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................................. මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, .......................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් සහතික කරමි.

........................................................
සහතික කරන නිලධාරියාගේ අත්සන
(ආයතන ප්‍රධානියා)

දිනය :..............................
සහතික කරන නිලධාරියාගේ නම :........................................
තනතුර :..........................
(රාජකාරි ලිපිනය සහිත නිල මුද්‍රාව)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................................... මහතා/ මිය/ මෙනෙවිය ........................................................... වශයෙන් කාර්යාලයේ/ ආයතනයේ සේවය කරන බවද, පූර්වාසන්න වසර 05 තුල සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව සහකාර මේට්‍රන් තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බව / නොහැකි බවද, ඔහු / ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය :.....................................  ...............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :
තනතුර :
ලිපිනය : (නිල මුද්‍රාව තබන්න)